සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. මැවිල්ලේ මුදුන් මල්කඩ ලෙස හැඳින්වූයේ,
    I. සතුන් ය. II. සාතන් ය. III. මනුෂ්‍යයා ය. IV. ආකාශ වස්තූන් ය.

02. ජොනතන්ගේ පුත්‍රයා වන්නේ,
    I. ආරොන් ය. II. බෙත්ෂෙබා ය. III. දාවිත් ය. IV. මෙපිබොෂෙත් ය.

03. ඉශ්‍රායෙල් ජනතාවගේ ප්‍රථම රජ වන්නේ,
    I. සාමුවෙල් ය. II. ජොනතන් ය. III. සාවුල් ය. IV. හෙරොද් ය.

04. කිතුනු දිවියේ වැදගත්ම සන්නිවේදන මාධ්‍යය වන්නේ,
    I. යාච්ඤාව ය. II. දේව වචනය ය. III. දෙව් මැදුර ය. IV. ජේසුස් වහන්සේ ය.

05. කානා නුවර පිළිබඳව සඳහන් කරන එකම ශුභාරංචි ග්‍රන්ථය වන්නේ,
    I. ලූක් ය. II. ජොහාන් ය. III. මතෙව් ය. IV. මාර්ක් ය.

06. රොටි 7ක් සහ මසුන් ස්වල්පයකින් ජේසුස් වහන්සේ පෝෂණය කළ මිනිසුන් සංඛ්‍යාව වන්නේ,
    I. 2000 කි. II. 3000 කි. III. 5000 කි. IV. 4000 කි.

07. ජේසුස් වහන්සේ විසින් කපර්ණවූමෙහි දී සුව කරනු ලැබුවේ,
    I. රාජ්‍ය නිළධාරියාගේ පුත්‍රයා ය. II. යායිරස්ගේ දියණිය ය.
    III. අංශභාග රෝගියා ය. IV. අතක් පණ නැති මිනිසා ය.

08. ''තබීතා'' ලෙස ආමන්ත්‍රණය කළේ,
    I. යායිරස්ගේ දියණියට ය. II. දොර්කස්ට ය.
    III. ළිඳ ළඟ සිටි ස්ත්‍රියට ය. IV. ශාරපෙත්හි වැන්දඹුවට ය.

09. ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැකබලා ගැනීමේ වගකීම දැරූ පුද්ගලයා වූයේ,
    I. මෝසෙස් ය. II. ජාකොබ් ය. III. පේදුරු ය. IV. සාවුල් ය.

10. ''සියල්ල දේව ගෞරවය උදෙසා කළ යුතු බව'' සඳහන් වන හසුන වන්නේ,
    I. තෙසලෝනික ය. II. ගීතාවලිය ය. III. කොරින්ති ය. IV. හිතෝපදේශය ය.

11. මාංසික තෘෂ්ණාවලට උදාහරණයක් නොවන්නේ,
I. බීමත්කම ය. II. කාමමිත්‍යාචාරය ය. III. ප්‍රේමය ය. IV. ආරවුල් ය.

12. ''ශුද්ධාත්මයාණන් වහන්සේගේ මාළිගාව'' ලෙස හඳුන්වන්නේ,
I. දෙව් මැඳුර ය. II. ශරීරය ය. III. මිල මුදල් ය. IV. විවාහය ය.

13. ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව,
I. ස්තුතිදීමේ යාච්ඤාවකි. II. පව් කමා කිරීමේ යාච්ඤාවකි.
III. ආත්මාර්ථකාමී යාච්ඤාවකි. IV. පරාර්ථකාමී යාච්ඤාවකි.

14. පාවුල් (සාවුල්)තුමාගේ සිත් හැරීම සිදුවන්නේ කොහේදී ද?
I. ජෙරිකෝවට යන අතරතුරදී ය.
II. දමස්කයට යන අතරතුරදී ය.
III. ජොප්පාවට යන අතරතුරදී ය.
IV. ගලීලයට යන අතරතුරදී ය.

15. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව ප්‍රකාශ කළේ,
I. සාවුල්තුමා ය. II. ජොහාන්තුමා ය. III. ස්තේපන්තුමා ය. IV. මොසෙස්තුමා ය.

16. ජේසුස් වහන්සේ සබත් දිනයේ දී සුවකරනු ලැබුවේ,
I. අන්ධ රෝගියෙකි.
II. අතක් පණ නැති රෝගියෙකි.
III. ලාදුරු රෝගියෙකි.
IV. අංශභාග රෝගියෙකි.

17. දම්වැලක පුරුකක් මෙන් ශුද්ධ බයිබලයේ අඛණ්ඩව දිවෙන තේමාව වන්නේ,
I. ධර්මිෂ්ටකමයි. II. විශ්වාසයයි. III. ප්‍රේමයයි. IV. ඇදහිල්ලයි.

18. උපස්ථායකයින් අතර ප්‍රධානිය වූයේ කවුරුන්ද?
I. සාවුල් ය. II. පිලිප් ය. III. සාමුවෙල් ය. IV. ස්තේපන් ය.

19. ''ස්වාමින් වහන්සේ මාගේ එඬේරාණෝය. අඟහිඟ මට නොවන්නේය.'' මෙම පාඨයෙන් පැහැදිලි වන්නේ,
I. දෙවිඳුන් දිව්‍ය පෝෂකයාණෝ බවය.
II. දෙවිඳුන් ගැලවුම්කරුවාණෝ බවය.
III. දෙවිඳුන් සර්වබලධාරියාණෝ බවය.
IV. දෙවිඳුන් රැකවරයාණෝ බවය.

20. දෙවියන් වහන්සේගේ සාක්ෂිකරුවන් ලෙස වර්තමාන සමාජයේ ජීවත්වන අප ක්‍රියා කළ යුත්තේ,
I. දිවැස්වැකි හා හාස්කම් පිළිබඳ විශ්වාස කිරීම ය.
II. අන් අයගේ වැරදි සොයා බැලීම ය.
III. අන් අයට පෙනෙන ලෙස යාච්ඤා කිරීම ය.
IV. ශුද්ධාමයාණන්ගෙන් සවිය, බලය ලබා දේව මෙහෙවරෙහි යෙදීම ය.

(ලකුණු 2×20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු ලියන්න.

I. නෝවාගේ පුතුන් දෙදෙනෙකු නම් කරන්න.
II. ඔබ යාච්ඤා කරන විට සිටිය යුතු ඉරියව් 2 ක් ලියන්න.
III. දාවිත් රජුගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා 2 ක් ලියන්න.
IV. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රථම හාස්කම කුමක්ද? එය සිදුකරන ලද්දේ කොහේදී ද?
V. ජේසුස් වහන්සේ විසින් සුවය ලබා දුන් රෝගීන් දෙදෙනෙකු නම් කරන්න.
VI. ශ්‍රාවකයන් ඇතුළු මුල් සභාව ශුද්ධාත්ම බලය ලැබුවේ කවදාද?
VII. රාජ්‍ය නිලධාරියාගෙන් විදහා දැක්වුනු චරිත ලක්‍ෂණ 2 ක් ලියන්න.
VIII. ප්‍රේරිතයන් ශුද්ධාත්මදානය ලද පසු සිදු කළ පළමු බලවත් ක්‍රියාව කුමක්ද?

(ලකුණු 2×8= 16)

02. I. දොස් සහිත සමාජයක නිදොස් ලෙස ජීවත්වීමේ අභියෝගය ජයගත් පුද්ගලයා නම් කරන්න.
II. දාවිත්ගේ ජීවිත පැවැත්ම තුළින් පිළිබිඹු වූ යහපත් ගුණාංග 3 ක් ලියන්න.
III. කිතුනු දරුවෙකු ලෙස ඔබ නිවසේදී, පාසලේදී, සමාජයේදී ක්‍රියාකරන ආකාර 2 බැගින් ලියන්න.

(ලකුණු 2+3+6= 11)

03. I. එලියා දිවැසිවරයා පෝෂණය වූ ආකාර දෙක නම් කරන්න.
II. හාරදහසකට ආහාර සැපයීමේ කතාව කෙටියෙන් ලියන්න.
III. අපගේ එදිනෙදා අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට අවැසි වරම් ඉල්ලා දෙව්පියාට සිදුකරන යාච්ඤාවක් ලියන්න.

(ලකුණු 2+3+6= 11)

04. I. කිතුනු සභාව වෙනුවෙන් පළමුවෙන්ම තම ජීවිතය පූජා කළ වේදසාක්ෂිකයා කවුද?
II. මුල් කිතුනු සභාව මුහුණු දුන් පීඩා 3 ක් ලියන්න.
III. කිතුනු දරුවෙකු ලෙස ඔබ සමාජය තුළ ක්‍රියා කරන ආකාර 6 ක් ලියන්න.

(ලකුණු 2+3+6= 11)

05. I. ''බීමත්කමට මුලාවන්නා මෝඩයෙකි.'' මෙලෙස සඳහන් වන්නේ ශුද්ධ බයිබලයේ කුමන ග්‍රන්ථයේ ද?
II. මාංසික තෘෂ්ණා 3 ක් නම් කරන්න.
III. බීමත්කම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල 3ක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2+3+6= 11)

06. I. තාක්ෂණයේ නව මංපෙත් කරා පිවිසීමට මිනිසාට දෙවිඳුන් ලබා දී තිබෙන විශේෂ දීමනාව කුමක්ද?
II. නව තාක්ෂණික උපකරණ පාලනයකින් තොරව භාවිත කිරීමේ අනිසි ප්‍රතිවිපාක 3 ක් ලියන්න.
III. නව තාක්ෂණයේ දියුණුව දේව සේවය සඳහා භාවිතා කළ හැකි අවස්ථා 3 ක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2+3+6= 11)